සති පාසල

7 ශ්‍රේණිය | විද්‍යාව | ඔක්තෝබර් 2වන සතිය

18 - ඛනිජ හා පාෂාණ

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 102 හි දක්වෙන ක්‍රියාකාරකම 18.1 සිදු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 103 පිටු අංක යටතේ ඇති **ඛනිජ හා පාෂාණවල ලක්ෂණ** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරමින් ඛනිජ හා පාෂාණවල ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 104 - 106 පිටු අංක යටතේ ඇති **පාෂාණ වර්ගීකරණය** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරමින් ආග්නේය පාෂාණ, අවසාධිත පාෂාණ හා විපරීත පාෂාණ පිළිබඳව අධ්‍යයනය කරන්න.
- ඔබ උගත් කරුණු ඇසුරෙන් කෙටි සටහනක් සකස් කරන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී ගර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය විද්‍යාව දෙවන පෙළ පොත (පිටු අංක 102 සිට 106)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=21#section-18
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=986&section=18
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=Urg4hAS85Gk&t=21s

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- ඛනිජ හා පාෂාණවල ලාක්ෂණික හඳුනාගැනීම.
- ඛනිජ හා පාෂාණ වෙන් කිරීම.

04. ඇගයීම

1) වගන්ති නිවැරදිනම් ✓ ලකුණත් වැරදි × නම් ලකුණත් යොදන්න.

a) පාෂාණ ජීර්ණයෙන් පස සෑදේ. ( )
b) ඛනිජයක් සෑදෙන්නේ එක් සංඝටකයකිනි. ( )
c) පාෂාණයක් ස්ඵටිකරූපී ද්‍රව්‍යයකි. ( )
d) ග්‍රැනයිට් හා නයිස් එදිනෙදා ව්‍යවහාරයේ දී කළුගල් නමින් හැඳින්වේ. ( )
e) ලාවා සිසිල් වීමෙන් මැග්මා සෑදේ. ( )
f) අවසාදිත පාෂාණ තද බවින් අඩුම පාෂාණ වර්ගයයි. ( )
g) පොස්පේට් පොහොර නිෂ්පාදනයට ඩොලමයිට් යොදා ගනී. ( )